# වාරිමාර්ග අමාත්‍යාංශය

# ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

## දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය (CRIWMP)

වාරිමාර්ග අමාත්‍යාංශය විසින් හරිත දේශගුණික අරමුදල (GCF) මගින් අරමුදල් සපයනු ලබන දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය (CRIWMP) සඳහා 2019 මාර්තු 05 වන දින දකමී දරන "ව්‍යාපෘතීන්හි, කාර්ය මණ්ඩල හා වැටුප් කළමනාකරණය" පිළිබඳ 2019/01 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛය ප්‍රකාරව, පහත සඳහන් තනතුරු සඳහා "කොන්ත්‍රාත් පදනම" මත ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි සේවයට බඳවා ගැනීම අරභයා, යථා පරිදි සුදුසුකම් ලත් හා මනා පළපුරුදු ශ්‍රී ලාංකීය පුරවැසියන් වෙතින් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

ව්‍යාපෘතිය 2017 වසර සිට ආරම්භව වසර 07 ක කාලසීමාවක් සඳහා පරිපාලන දිස්ත්‍රික්ක හතක (07 ක) මිණිය, මල්වතු ඔය සහ යාන්ඔය ගංගා ද්‍රෝණිවල ක්‍රියාත්මක කරනු ලබනු ඇත.

**වයස** : අවුරුදු 45 ට අඩු

අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවයන් දක්වනු ලබන අතර, ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීණතාව සහ රජයේ නීති රෙගුලාසි පිළිබඳ හුරු පුරුදු බව හා පරිගණක සාක්ෂරතාව සහිත වීම අත්‍යවශ්‍ය හා අනිවාර්ය පූර්ව අවශ්‍යතාවයන් වනු ඇත.

### 01. ව්‍යාපෘති ඉංජිනේරු - PS4 කාණ්ඩය / වර්ගය A - ක්ෂේත්‍ර පාදක

**තනතුරු 01** - **කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක**

**තනතුරු 01** - **වවුනියාව සහ මන්නාරම දිස්ත්‍රික්ක**

**තනතුරු 01** - **අනුරාධපුර පොළොන්නරුව සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක**

**අවශ්‍ය සුදුසුකම්**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම

හෝ

- සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ උපාධියට තත්ත්වයෙන් සමාන සුදුසුකම් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්

හෝ

- සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීයවේදී ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීයවේදී සුදුසුකමක්

සමග

- අදාළ ක්ෂේත්‍රයේ අවම තරමින් වසර හතක (07) ක පශ්චාත් යෝග්‍යතා (සුදුසුකම් ලැබීමෙන් පසු ලත්) පළපුරුද්ද.

02. රජයේ දීප ව්‍යාප්ත සේවයේ III/II පංතියේ හෝ ඉහළ පංතියක නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයේ නිලධාරියෙකු වීම

සමග

III / II පංතියේ තනතුරක අවම තරමින් වසර 07 (හතක) පළපුරුද්ද.

**වැටුප් මට්ටම** : රු. 115,000.00 - රු. 130,000.00*

2019/01 දරන MSD (කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු) චක්‍රලේඛය ප්‍රකාරව ඉහත නිශ්චිත වැටුපට අතිරේකව ජීවන වියදම් දීමනාවද ගෙවනු ලැබේ.

### 02. ව්‍යාපෘති ඉංජිනේරු - PS4 කාණ්ඩය / වර්ගය B

**තනතුරු 01** - **කොළඹ ප්‍රධාන කාර්යාලය පදනම්ව හා ක්ෂේත්‍රයට අදාළ සංචාර / චාරිකාද සමග**

**අවශ්‍ය සුදුසුකම් :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම

හෝ

- සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්

හෝ

- සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීයවේදී ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක් / සමාන වෘත්තීයවේදී සුදුසුකමක්

සමග

- සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ අවම තරමින් වසර පහක (05) ක පශ්චාත් යෝග්‍යතා (සුදුසුකම් ලැබීමෙන් පසු ලත්) පළපුරුද්ද.

02. රජයේ දීප ව්‍යාප්ත සේවයේ III / II පංතියේ හෝ ඉහළ පංතියක නිලධාරියෙකු වීම හෝ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයේ නිලධාරියෙකු වීම

සමග

- III / II පංතියේ තනතුරක අවම තරමින් වසර 05 (පහක) පළපුරුද්ද.

**වැටුප් මට්ටම** : රු. 100,000.00 - රුපියල් 110,000.00.

- 2019/01 දරන MSD (කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු) චක්‍රලේඛය හි නිශ්චිත පරිදි ඉහත විශේෂිතව දක්වා ඇති වැටුපට අතිරේකව ජීවන වියදම් දීමනාව ද ගෙවනු ලැබේ.

### 03. සන්නිවේදන හා තොරතුරු තාක්ෂණ සහකාර

**(ප්‍රවර්ගය : කළමනාකරණ සහකාර) - කොළඹ පාදකව**

**අවශ්‍ය සුදුසුකම්**

- අපොස (සා/පෙ) විභාගය එකම වාරයකදී සම්මාන සාමාර්ථ තුනක් (03) ක් සහිතව ඉංග්‍රීසි හා සිංහල / දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06) කින් සමත් වීම සහ අපොස (උ/පෙ) විභාගය එකම වාරයකදී විෂයයන් තුනකින් (03) කින් / විෂයයන් හතරකින් (04) කින් සමත්වීම.

සමග

- කළමනාකරණ සහකාරවරයෙකු ලෙස හෝ සමාන තත්ත්වයක රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ තනතුරක අවම වශයෙන් වසර 02 (දෙකක) සේවාස්ථ පළපුරුද්ද.
- භාෂා ත්‍රිත්වයෙන් (03) එනම් : සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවන් ගෙන් (ලිඛිත දක්ෂතාව හා කථන හැකියාව යන ද්විත්වයම (02) වැඩ කිරීමේ හැකියාව අනිවාර්ය වනු ඇත.
- ජන මාධ්‍ය සහ සන්නිවේදනය පිළිබඳව හෝ අදාළ විෂයයකින් ලත් ප්‍රථම උපාධියක් ලබා තිබීම කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.
- විදේශ රටවල අරමුදල් මගින් ප්‍රතිපාදිත ව්‍යාපෘතිවල සේවය කිරීමෙන් ලත් කාර්ය පළපුරුද්දක් සහිත අපේක්ෂකයින් හට ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

**වැටුප් මට්ටම / කලය** : 2019 මාර්තු මස 05 වන දින දකමී හා අංක 2019/01 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව

- MSD (කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු) චක්‍රලේඛ අංක 01/2019 ප්‍රකාරව ඉහත නිශ්චිත වැටුපට අතිරේකව ජීවන වියදම් දීමනාවද ගෙවනු ලැබේ.

**අයදුම්පත් :**

අයදුම්කරුවන් විසින් සිය ජීව දත්ත තොරතුරු ප්‍රකාශ (CV) අධ්‍යාපන හා වෘත්තීයවේදී සුදුසුකම් හා පළපුරුද්ද ඇතුළත්ව, දැනින් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ විමසුම් විස්තරද සමග පහත ලිපිනයට යොමුකළ යුතුය.

සිය ඉහළම සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව කෙටි ලැයිස්තු ගත කරනු ලබන අයදුම්කරුවන් තම කුසලතාවයන් මත පාදකව සම්මුඛ පරීක්ෂණයකට කැඳවා තෝරාගනු ලැබේ. සිය මුලික සුදුසුකම් සනාථ කිරීම සඳහා සියලු සහතික පත්‍රවල පිටපත් අයදුම්පත් සමග අමුණා අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතු වන අතර, සියලු අසම්පූර්ණ අයදුම්පත් කාරණාකීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තු / ආයතන / අර්ධ රාජ්‍ය අංශයේ ආයතනවල දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරුවන් / විසින් ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර පැහැදිලිව සටහන් කර 2020 ඔක්තෝබර් මස 05 වන දිනට හෝ ඊට පෙර පහත ලිපිනයට ලේඛනගත (ලියාපදිංචි කළ) තැපෑලෙන් යොමු කළ යුතුය.

**ලේකම්,**
**පරිපාලන / මානව සම්පත් අංශය,**
**වාරිමාර්ග අමාත්‍යාංශය,**
**අංක 500, ටී.බී. ජයා මාවත, කොළඹ 10.**
**දිනය : 2020 සැප්තැම්බර් 20**